**ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2015**

-----------------------------------------------

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 10(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත අරමුදල් පනතේ 11 වගන්තිය ප්‍රකාර සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළයුතු එකී පනතේ 10(4) වගන්තියෙහි සඳහන් ආදායම් හා වියදම් ප්‍රකාශනය ඇමුණුම් අංක 1 ලෙසද, අරමුදලට අයත් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය ඇමුණුම් අංක 2 ලෙසද ඇතුළත්කර අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2015 ජනවාරි 01 දිනැති අංක HealthMinistry/CA/011/2015 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියේ 11 ඡේදය | අතිකාල පැය 150 ඉක්මවා වැඩ කිරීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව අනුමැතිය ලබා ගැනීමකින් තොරව හා මාසික මූලික වැටුප ඉක්මවා 2015 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ අවස්ථා 72 කදී අක්ෂි බැංකුවේ හෙද නිලධාරීන් 8 දෙනෙකුට රු.557,834 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් ඉක්මවා තිබූ එකතුව රු.6,991,265 ක රැඳවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 6,443,292 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 49,171,867 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 42,728,575 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘතියේ වියදම් රු. 63,884,216 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

අරමුදලේ 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.102,502,994 ක අතිරික්තයක් වුවද 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.46,900,783 ක ඌනතාවයක් විය. නැවතත් 2014 වර්ෂයේදී අතිරික්තය රු.49,171,867 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය රු.6,443,292 දක්වා අඩු වී තිබුණි.

ඒ ඒ වර්ෂවල ලැබෙන පරිත්‍යාග වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණද එම පරිත්‍යාග මුදල් ඒ වර්ෂය තුළම උපයෝජනය නොකිරීම නිසා මූල්‍ය ප්‍රතිඵලයේ ප්‍රමාණාත්මක විචලනයන් සිදුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනත ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂක සේවා සපයන ආයතන සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂක සේවාවල නිරතව සිටින තැනැත්තන් අතර පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම හා ඒ අයගේ අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම, විශේෂ යෝජනා ක්‍රම සම්බන්ධ කාර්යයන් සඳහා ලැබෙන පරිත්‍යාග හැකිතාක් දුරට ඒ සඳහා උපයෝගී කර ගැනීම හා ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා මුදල් යෙදවීම සහ ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂක සේවා සඳහා භාවිතා කරනු ලබන වෛද්‍ය උපකරණ හා අත්‍යාවශ්‍ය ඖෂධ මිළට ගැනීම අරමුදලේ අරමුණු වේ. එම අරමුණු ඉටු කර ගැනීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) දිවයිනේ දුෂ්කර පළාත්වල සෞඛ්‍යාරක්ෂක සේවා සපයන ආයතනවල පවතින බොහෝ අඩුපාඩු අවමකර ගැනීම සඳහා අරමුදලේ සහාය ලබාගත හැකි බවට එම ආයතන දැනුවත් නොවීම හා දැනුවත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් අරමුදලේ අරමුණු ප්‍රමාණවත් මට්ටමකින් ළඟාකර ගෙන නොතිබුණි. 2012, 2013, 2014 හා 2015 වර්ෂවලදී සෞඛ්‍ය සංවර්ධන අරමුදල සතු පොදු අරමුදලේ පැවති වර්ෂය සඳහා උපයෝජනය කළ හැකිව තිබුණු අරමුදල් පිළිවෙලින් රු.230,311,207 ක්, රු.276,654,645 ක්, රු.261,124,443 ක් හා රු.295,194,406 ක් වූ අතර ඉන් පිළිවෙලින් සියයට 78 ක්, 62 ක්, 79 ක් හා 82 ක් අරමුදලේ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

(ආ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෘෂ්‍යාබාධිත සිසුන් 3,000 කට ඇස් කණ්ණාඩි ලබාදීමට විදේශීය රාජ්‍යයක් රු.3,044,000 ක පරිත්‍යාගයක් ලබාදීමට එකඟවී තිබූ අතර අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය 2012 ඔක්තෝබර් 01 දිනෙන් ආරම්භ කර 2013 සැප්තැම්බර් මාසයෙන් අවසන් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ලැබී තිබුණු මුළු පරිත්‍යාගය රු.2,289,402 ක් හා බෙදාදුන් ඇස් කන්ණාඩි ප්‍රමාණය 891 ක් විය. දුර්වල ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘති කාලය 2014 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයටද ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 30 ක් හා සියයට 45 ක් පමණක් විය. එසේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ 12 ක දෘෂ්‍යාබාධිත සිසුන් 3,283 ක් සිටින බව හඳුනාගෙන තිබූ නමුත්, ඇස් කණ්නාඩි ලබාදීමේ කටයුතු විෂන් 2020 ව්‍යාපෘතිය විසින් ඉටු කර නොතිබුණු අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ 6 ක දෘශ්‍යාබාධිත පාසැල් සිසුන් හඳුනාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 සිට 2018 වර්ෂය දක්වාවූ කාලය තුළදී කුරුළු වසංගත ඉන්ෆ්ලුවන්සාවට සාර්ථකව මුහුණදීමේ අපේක්ෂාවෙන් ආරම්භකර තිබුණු ව්‍යාපෘතියකට පූර්ව සූදානම් වැඩ සටහන් පැවැත්වීමට ඇමෙරිකා එක්සත් ජනපදය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.22,391,132 ක් සෞඛ්‍ය සංවර්ධන අරමුදල වෙත ලබාදී තිබුණි. මේ පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) නියමිත කාලය තුළදී ව්‍යාපෘති අරමුණු ඉටුකර ගත හැකි වන පරිදි කාල නිර්ණයන් සහිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට පිළියෙල කළ අයවැය ලේඛනය අනුව, ක්‍රියාකාරකම් 25 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණි. ඉන් ක්‍රියාකාරකම් 12 ක් සඳහා ප්‍රතිපාදනය කරන

ලද රු.10,702,700 ක්වූ මුළු මුදලම උපයෝජනය කර නොතිබුණු අතර ඉතිරි ක්‍රියාකාරකම් 13 ක් සඳහා වූ රු.11,688,432 ක ප්‍රතිපාදනය ඉක්මවා රු.1,091,969 ක් වැයකර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කරන ලද ක්‍රියාකාරකම් අනුව, පරීක්ෂණ සඳහා අවශ්‍ය වන රසායන ද්‍රව්‍ය (Reagents & Consumables) මිලදී ගැනීමට සළසා තිබුණු රු.6,170,100 ක ප්‍රතිපාදනය ඉක්මවා රු.2,404,950 ක් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී සිදුකිරීමට සැළසුම්කළ Influenza Like Illness (ILI) පරීක්ෂණ 1,080 කින් පරීක්ෂණ 570 ක් හා Severe Acute Respiratory Infection (SARI) පරීක්ෂණ 240 කින් පරීක්ෂණ 120 ක් පමණක් සිදුකර තිබුණි.

(ඇ) නිශ්චිත කාර්යයන් 11 කට ලැබුණු රු.16,853,756 ක පරිත්‍යාග වර්ෂ 3 ත් වර්ෂ 28 ත් අතර කාලයක් අරමුණුගත කාර්යයන්ට උපයෝජනය කර නොතිබුණු අතර අවශ්‍යතාවය සළකා බලා වෙනත් සුදුසු කාර්යයක් වෙනුවෙන් හෝ එම මුදල් යෙදවීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනයේ මානසික සෞඛ්‍ය පුහුණුව වෙනුවෙන් වැයකිරීමට අරමුදලට පරිත්‍යාග කළ රු.384,560 ක් නියමිත කාලය තුළදී අදාළ කාර්යයට වැය නොකිරීම හේතුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත ආපසු යැවීමට සිදුවී තිබුණි.

(ආ) සෞඛ්‍ය සංවර්ධන අරමුදලෙන් පෝෂණය වන ශ්‍රී ලංකා අක්ෂි බැංකුව පිහිටුවීමේදී සිංගප්පූරුවේ Asia Cornea Foundation ආයතනය සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම ප්‍රකාරව, ශ්‍රී ලංකාව තුළ දේශීය වශයෙන් සිදු කරන ශල්‍යකර්ම සඳහා ශ්‍රී ලංකා අක්ෂි බැංකුව විසින් අයකිරීමකින් තොරව අක්ෂි පටල සපයනු ලැබේ. අක්ෂි බැංකුවෙන් අක්ෂි පටල ලබාගන්නා බොහෝ වෛද්‍යවරු අදාළ ශල්‍යකර්ම පෞද්ගලික රෝහල්වලද සිදු කරන නමුත් අදාළ රෝගීන්ගෙන් මෙම අක්ෂි පටල සඳහා මුදල් අය නොකරනු ලබන බවට තහවුරුවක් ශ්‍රී ලංකා අක්ෂි බැංකුව විසින් ලබාගෙන නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් මිලදී ගැනීමට නියමිත යන්ත්‍ර පිළිබඳ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිමකර තෝරා ගෙන තිබුණු සැපයුම්කරු වෙත යන්ත්‍ර වටිනාකමෙන් සියයට 20 ක අත්තිකාරම් මුදලද ගෙවීමෙන් පසුව එම යන්ත්‍ර පරීක්ෂාව සඳහා නිලධාරීන් 4 දෙනෙකු විදේශගතවී තිබුණි. තාක්ෂණික දැනුමැති කණ්ඩායමක් යා යුතු බව නිර්දේශවී තිබුණද නිලධාරීන් 4 දෙනාගෙන් තිදෙනෙකුම තාක්ෂණික දැනුමක් නොමැති නිලධාරීන් විය. තවද සැලසුම් කළ දින 7 ක සංචාරය වෙනුවට දින 10 ක් ගතකිරීම නිසා ඇස්තමේන්තු කළ මුදලට වඩා රු.464,111 ක් වැයකර තිබුණි. ඇමෙරිකා එක්සත් ජනපද ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිලධාරියෙකුගේ ගමන් වියදම් හා යැපීම් දීමනාද ඇතුළුව විදේශ ගමන සඳහා අරමුදලින් වැයකළ මුළු මුදල රු.3,600,000 ක්වූ අතර ගුවන් ගමන් ප්‍රවේශ පත්‍රය ඇතුළු වෙනත් අදාළ ලියකියවිලි මගින් අරමුදල විසින් වියදම තහවුරු කරගෙනද නොතිබුණි.

(ආ) ජාතික ලේ බැංකුවට අත්‍යාවශ්‍ය, ක්ෂණික මූල්‍ය අවශ්‍යතාවයන් සඳහා පමණක් අරමුදල් යෙදවීමේ අරමුණින් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල යටතේ 2001 වර්ෂයේදී මධ්‍යම ලේ

බැංකු සංවර්ධන අරමුදල පිහිටුවා තිබුණි. එහෙත් එම අරමුණට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ජාතික රුධිරදායක දිනය හා රුධිර පාරවිලයන සේවයේ වාර්ෂික අධ්‍යයන සැසිය පැවැත්වීමට මධ්‍යම ලේ බැංකු සංවර්ධන අරමුදලින් රු.2,036,076 ක් වැයකර තිබූ අතර ඉන් රු.1,103,895 ක් වැයකර මිලදීගත් සෙරමික් ජෝගු 5,000 අවශ්‍යතාවය විගණනයට තහවුරු නොකෙරුණි.

### 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුත්තලම හෙද නේවාසිකාගාරයේ 2 වන අදියරේ වැඩ අවසන් කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් දින 33 කට රු.132,557 ක්වූ ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණු අතර කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 15 ක් ඉක්මවා එනම් පිරිවැය රු.1,880,809 ක අමතර වැඩ ඉටු කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ජාතික අක්ෂි රෝහලට රු.2,550,000 ක් වැයකර ආපනශාලා ගොඩනැගිල්ලක් ඉදිකර පරිත්‍යාග කිරීමට ජාතික ලොතරැයි මණ්ඩලය එකඟවී එයින් රු.1,079,207 ක් 2013 ඔක්තෝබර් මාසයේදී අරමුදලට එවා තිබුණි. 2013 මාර්තු 10 දින පිරිනැමූ කොන්ත්‍රාත්තුව සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විට රු.1,079,207 ක් ගෙවා තිබුණි. එහෙත් එදිනට ඉටුකළ වැඩවල වටිනාකම රු.791,536 ක්ව පැවතියදී කොන්ත්‍රාත්තුව අතහැර දමා ගොස් තිබුණි. ඒ අනුව ඉටු නොකළ වැඩ සඳහා කොන්ත්‍රාත්කරුට රු.287,671 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල ආරම්භයේ සිටම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව අරමුදලෙහි ඇස්තමේන්තුගත වියදම් සමග තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 18 සිට සියයට100 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපති වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති | උත්සව හා වැඩසටහන් සඳහා දීමනා ගෙවීමේදී හා ආහාර ද්‍රව්‍ය සඳහා වියදම් දැරීමේදී සහභාගීත්වය පිළිබඳ නිවැරදි තහවුරුවක් ලබා ගෙන නොතිබුණි. |
| (ආ) ඉදිකිරීම් කොන්ත්‍රාත් | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව හා සැලසුම් හා ඇස්තමේන්තු අනුව කාර්යයන් ඉටුවන බවට මනා අධීක්ෂණයක් නොතිබුණි. |

*ඇමුණුම 01*

*ආදායම් හා වියදම් ප්‍රකාශනය*

*------------------------------*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත පරිදි දක්වා ඇත.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2015 | | 2014 | |
| | රු. | රු. | රු. | රු. |
| ආදායම | | | | |
| ජාතික සම්පත ලොතරැයි ආදායම | 69,322,320 | | 64,901,840 | |
| පරිත්‍යාග | 154,629,240 | | 151,032,180 | |
| ආයෝජන පොලී | 20,527,297 | | 23,080,887 | |
| අනිකුත් ආදායම් | 51,628,084 | | 35,616,537 | |
| | | 296,106,941 | | 274,631,444 |
| වියදම | | | | |
| පරිපාලන වියදම් | 2,534,903 | | 2,206,057 | |
| මූල්‍ය හා අනෙකුත් වියදම් | 23,010 | | 32,000 | |
| සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති වියදම් | 287,105,736 | | 223,221,520 | |
| | | (289,663,649) | | (225,459,577) |
| අතිරික්තය | | 6,443,292 | | 49,171,867 |

*ඇමුණුම 02*

**ආයෝජන ප්‍රකාශය**

**ස්ථාවර තැන්පත්- මහජන බැංකුව**

| සහතිකයේ අංකය | ආයෝජනය කළ දිනය | ආයෝජන කාලය | 2015 ජනවාරි 01 දිනට ශේෂය | 2015 වර්ෂය තුළ ආයෝජනය | 2015 වර්ෂයේ ආපසු ගැනීම් | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. |
| 865632 | 2013/12/21 | මාස 3 | 63,000,000 | - | 63,000,000 | - |
| 865633 | 2013/12/21 | මාස 3 | 23,000,000 | - | - | 23,000,000 |
| 865616 | 2013/12/14 | මාස 3 | 15,000,000 | - | | 15,000,000 |
| 331419 | 2013/10/08 | මාස 3 | 1,500,000 | - | - | 1,500,000 |
| 865615 | 2013/12/14 | මාස 3 | 20,000,000 | - | - | 20,000,000 |
| 865614 | 2013/12/14 | මාස 3 | 20,000,000 | - | 20,000,000 | - |
| 865606 | 2013/12/05 | අවු: 1 | 50,000,000 | - | - | 50,000,000 |
| 865627 | 2013/12/21 | මාස 3 | 35,000,000 | - | - | 35,000,000 |
| | | | 227,500,000 | | 83,000,000 | 144,500,000 |

**භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව**

| සහතිකයේ අංකය | ආයෝජනය කළ දිනය | ආයෝජන කාලය | 2015 ජනවාරි 01 දිනට ශේෂය | 2015 වර්ෂය තුළ ආයෝජනය කිරීම් | 2015 වර්ෂයේ ආපසු ගැනීම් | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | දින | රු. | රු. | රු. | රු. |
| 314 | 2014/02/21 | 350 | 17,540,972 | - | - | 18,704,743 |
| 314 | 2014/12/26 | 182 | 4,863,815 | - | - | 4,844,960 |
| 314 | 2014/08/29 | 182 | 40,477,098 | - | - | 40,388,919 |
| 314 | 2015/09/25 | 182 | - | 19,347,040 | - | 19,347,040 |
| M 13 B 026845 | 2014/12/29 | 04 | 16,000,000 | - | 16,000,000 | - |
| M 13 B 026303 | 2014/12/29 | 13 | 35,000,000 | - | 35,000,000 | - |
| 1036618 | 2015/12/21 | 14 | - | 12,500,000 | - | 12,500,000 |
| M 15 B - 015915 | 2015/09/08 | 182 | - | 80,000,000 | - | 80,000,000 |
| 1002410 | 2015/12/30 | 05 | - | 13,000,000 | - | 13,000,000 |
| 1036614 | 2015/12/21 | 14 | - | 10,500,000 | - | 10,500,000 |
| | | | 113,881,885 | 135,347,040 | 51,000,000 | 199,285,662 |